(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 459.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 ජූනි මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4589/'13

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) විදේශීය රටවල රැකියා සඳහා ගොස් සිටින රට විරුවන්ට විශ්‍රාම වැටුපක් ලබාදීම සඳහා 2010 ජනාධිපතිවරණයට පෙර පොරොන්දු වූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රට විරුවන් සඳහා විශ්‍රාම වැටුපක් ලබාදීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) රට විරුවන් සඳහා විශ්‍රාම වැටුප ලබාදීමේදී රට විරුවන්ගෙන්, රැකියා ආයතනයෙන් සහ රජය මඟින් දායකත්වය දරනු ලබන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විශ්‍රාම වැටුප ලෙස මාසිකව ලබාදීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) විදේශ රැකියාවල නියුතුවූවන්ට විශ්‍රාම වැටුප් ලබා දෙන ලෝකයේ වෙනත් රටවල් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4783/'14

2\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී,

(i) කුරුණෑගල දිස්ත්‍රික්ක තුළ වන අලි පහරදීම් නිසා මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව;

(ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා එම දිස්ත්‍රික්කය තුළ මිය ගිය වන අලි සංඛ්‍යාව;

(iii) සමස්ත දිවයින තුළ මියගිය වන අලි සංඛ්‍යාව;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5272/'14

3\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොලිස්පති චක්‍රලේඛ 2416/2013 සහ ආයතන චක්‍රලේඛ 01/2013 යටතේ "2013 පොලිස් නිලධාරීන්ගේ දීමනා වැඩි කිරීමට" යටත් නොවන පොලිස් නිලධාරීන් කොට්ඨාස හෝ නිලධාරීන් සිටින්නේද;

(ii) එසේ නම්, එම පොලිස් නිලධාරී කොට්ඨාසයන් හෝ නිලධාරීන් කවරේද;

(iii) ඉහත චක්‍රලේඛ අනුව එම කොට්ඨාසයේ නිලධාරීන්ගේ දීමනා වැඩි නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලිස් ඉංජිනේරු සේවයෙහි යෙදෙන්නන් පොලිස් නිලධාරී ගණයට අයත් නොවන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5907/'15

4\.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට මරණ දඬුවම නියම වී බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලැබ බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) මරණ දඬුවම නියමවූවන්ගේ සහ ජීවිතාන්තය දක්වා සිරගතවූවන්ගේ යහපත් කල්ක්‍රියාව සළකා බලා ඔවුන්ට ලබා දී ඇති දඬුවම් ලිහිල් කිරීම අවසාන වශයෙන් සිදු කර ඇති දිනය කවරේද;

(iv) එවැනි දඬුවම් ලිහිල් කිරීමක් සිදු කර නොමැති නම්, එසේ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5911/'15

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාවකාලික, අනියම් (දෛනික), ආදේශක සහ කොන්ත්‍රාත් පදනම් යටතේ රාජ්‍ය සේවයට බඳවා ගෙන දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුදෙනාගේ සේවය ස්ථිර කිරීමේ යෝජනාවක් 2015 අයවැය මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ බවත්;

(ii) ඊට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 නිකුත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් "දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය" යන්න 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය යෝජනා මඟින් "අවුරුදු 07ක් රාජ්‍ය සේවයේ අනියම් පදනමින් සේවය කළ අය" ලෙස වෙනස් කර තිබේද;

(ii) ඉහත අයවැය යෝජනා දෙක අතරින් ක්‍රියාත්මක වන්නේ කවර යෝජනාවද;

(iii) එම යෝජනාව අනුවත්, ස්ථිර නොකරන කම්කරුවන් තවදුරටත් අනියම් පදනම යටතේ, සේවා අවශ්‍යතාවය අනුව සේවයේ යොදවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5918/’15

6\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණ සමයේදී ත්‍රිකුණාමලය, නුවර පාරේ, මට්ටිකෙලි නමැති ස්ථානයේ තිබූ අවසරලත් මැතිවරණ මෙහෙයුම් කාර්යාලයට 2015.01.04 දින මැතිවරණ නිලධාරින් ලෙස හඳුන්වාගත් පිරිසක් සහ පිටස්තර පිරිසක් පැමිණ කලහකාරීව හැසිරී, එහි තිබූ වීඩියෝ උපකරණ හා කාර්යාල උපකරණ පැහැරගෙන ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අවස්ථාවේදී කාර්යාලයේ සිටි පිරිස පැමිණි පිරිසෙන් කළ කරුණු විමසීම මැතිවරණ නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමක් ලෙස සලකන්නේද;

(ii) මැතිවරණ කාල සීමාවෙහි අනුමත කාර්යාලයක් තුළවත් තොරතුරු, චිත්‍රපට ආදිය ප්‍රදර්ශනය කිරීම, කථා පැවැත්වීම හෝ වෙනත් මැතිවරණ ප්‍රචාරක කටයුත්තක් සිදු කිරීමට නොහැක්කේද;

(iii) අපරාධ නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති අයුතු ඇතුළුවීම, කලහකාරී ලෙස හැසිරීම යනාදී චෝදනා ඉහත (අ) හි සඳහන් ආකාරයට හැසිරෙන මැතිවරණ නිලධාරීන්ට අදාළ නොවන්නේද;

(iv) ඉහත කාර්යාලය තුළ කලහකාරීව හැසිරී, එහි උපකරණ පැහැර ගෙන ගොස්, කාර්යාලය පවත්වාගෙන ගිය අයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර ඇති නිලධාරීන්ට එරෙහිව යහ පාලනය යටතේ ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5921/’15

7\.

ගරු විදුර වික්‍රමනායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගවත්ත ග්‍රාම නිලධාරී වසමේ රජයේ ඉඩම් කොටසක් සමාජ සේවා කටයුත්තක් සඳහා යන පදනමින් ලබා ගෙන පෞද්ගලික සමාගමක් විසින් වාණිජමය අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාරයක් සඳහා යොදාගෙන ඇති බවත්;

(ii) ජල රක්ෂිත ඉඩමක පිහිටි ඉහත සමාගමේ ක්‍රියාකාරකම් හේතුකොට ගෙන ප්‍රදේශයේ ජනතාව පානීය ජලය ලබා ගන්නා මාවක්ඔයේ ජලය අපවිත්‍ර වන බවත්;

(iii) එම රක්ෂිත ඉඩම් ආපසු ලබා දෙන ලෙස අදාළ ආයතනයට ලිඛිතව දැනුම්දීමක් කර, එම දැනුම්දීමට අනුව ඉඩම භාරදීමට කටයුතු නොකළහොත් නැවත පවරා ගැනීමට පියවර ගන්නා බවට 2013 නොවැම්බර් 26 වැනි දින පවත්වන ලද ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමේදී එවකට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රකාශ කර ඇති බවත්;

(iv) මෙතෙක් එකී ආකාරයට කටයුතු කර නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5926/'15

8.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාවිඇල - කිරිමැටියාව මාර්ගයේ දෙවැනි අදියර, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිකටපිටිය - ඉහලගම මාර්ගයේ දෙවැනි අදියර සහ වඩුමුන්න -මඩන මාර්ගය යන මාර්ගවල කාපට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අනුමත වී, කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර එම සංවර්ධන කටයුතු ආරම්භ කළ බවත්;

(ii) මේ වන විට එම මාර්ග සංවර්ධන කටයුතු හදිසියේම නතර කර ඇති බවත්;

(iii) එබැවින් දැඩි අබලන් තත්ත්වයේ පවතින ඉහත මාර්ගයන්හි ගමනාගමන කටයුතු ඉතා දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයන්හි සංවර්ධන කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(ii) එකී මාර්ගයන්හි සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5940/'15

9.

ගරු අනුර දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2010 දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාවට බඳවා ගැනීම සඳහා සලකා බැලූ අධ්‍යාපන සුදුසුකම් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාව සඳහා බඳවා ගත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වර්ෂයේදී බඳවා ගත් කණ්ඩායමට අයත් වූ යෝෂිත රාජපක්ෂ මහතාගේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යෝෂිත රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳුනු දිනය කවරේද;

(ii) ඔහු පුහුණුව සඳහා බ්‍රිතාන්‍යයේ රාජකීය නාවික ඇකඩමියට බැඳුනු දිනය කවරේද;

(iii) එම පාඨමාලාව සඳහා යෝෂිත රාජපක්ෂ මහතා තෝරා ගැනීමට අදාළ කරගත් නිර්ණායක කවරේද;

(iv) ඔහු එම පුහුණුව අවසන් කළ දිනය කවරේද;

(v) එම පුහුණුව අවසානයේ පැවති විභාගවලින් ඔහු ලද ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6037/ 15

10\.

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධකම් ඇති පිරිසකට කොන්ත්‍රාත්තුවක් ලබා දුන්නේයැයි එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිත වන ක්ෂේනුකා සෙනෙවිරත්න මහත්මියට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳව; සහ

(ii) එක්සත් රාජධානියේ හිටපු මහ කොමසාරිස් ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතාට පහරදීමේ සිද්ධියෙන් පසුව සෙනෙවිරත්න මහත්මිය විසින් ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් චෝදනා එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිතවරුන්ගෙන් කෙනෙකු වන තමරා කුනනායගම් මහත්මිය විසින් සෙනෙවිරත්න මහත්මිය සමඟ තිබූ පෞද්ගලික ආරවුලක් නිසා සිදු කළ බව මෑතකදී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කිරීමට ඔහු සතුව සාක්ෂි තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම චෝදනා සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර තිබේද;

(ii) එම චෝදනා පිළිබඳව වන විමර්ශන වාර්තා සභාගත කරන්නේද;

(iii) ඉහත (අ) (i) හි සඳහන් කොන්ත්‍රාත්තුව පිළිබඳව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් විසින් සකස් කරන ලද විගණන වාර්තාව කියවා තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4784/’14

11\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ වන අලි නිසා සිදුවන මිනිස් ජීවිත හානි සංඛ්‍යාව අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද;

(ii) වන අලින්ගෙන් ආරක්ෂා වීම සඳහා මුළු දිවයිනටම අවශ්‍ය වී ඇති විදුලි වැටවල (අලි වැටවල) දිග ප්‍රමාණය පිළිබඳ දැනුවත් භාවයක් තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය විදුලි වැටවල දිග ප්‍රමාණය කොපමණද;

(v) විදුලි වැට ඉදිකිරීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4813/'14

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී දැනට නිදහස් වෙළඳ කලාපය තුළ වාහන එකලස් කර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලබන මෝටර් රථ මාසයක් ඇතුළත ලියාපදිංචි කරන බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ලිපියක් ගැණුම්කරුවන්ට පෙන්වනු ලබන බවත්;

(ii) එසේ නමුත්, එම සමාගම මගින් විකුණන ලද වාහන ලියාපදිංචි කිරීම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවත්;

(iii) ඒ හේතුවෙන් එම සමාගමෙන් මෝටර් රථ මිල දී ගෙන ඇති ගැණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් තම වාහන ධාවනය කිරීමට නොහැකිව දැඩි අපහසුතාවයකට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගමෙන් මිලදී ගන්නා ලද වාහන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර ගැනීම සඳහා පහසුකම් සලසා දෙන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5223/'14

13.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී සමස්ත බැංකු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් බැංකුවේ වත්කම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් බැංකුව මගින් රජයට ලබා දී ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම බැංකු මගින් රජයට ලබාදුන් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4819/'14

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත්, වායු සමනය කළ, සුඛෝපභෝගී වාහන ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.
අභාවප්‍රාප්ත ගරු දයානන්ද ඒ. වික්‍රමසිංහ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.
අභාවප්‍රාප්ත ගරු ජී. එන්. මහසෙන් පැල්පොල මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.
අභාවප්‍රාප්ත ගරු ආ. මු. මුනිදාස ප්‍රේමචන්ද්‍ර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

4.
අභාවප්‍රාප්ත ගරු අතුල නිමලසිරි ජයසිංහ විජයමුණිදේව මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

5.
අභාවප්‍රාප්ත ගරු එම්. අයි. උදුමාලෙබ්බේ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම**

1.
මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන),— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,700,000,000 සිට<br>රු. 2,200,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,102,000,000 සිට<br>රු. 6,602,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 850,000,000 සිට<br>රු. 1,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000<br>රු. 25,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000<br>රු. 2,500,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,500,000,000<br>රු. 2,250,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000<br>රු. 170,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 450,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 | 7,000,000 | 10,000,000 | 3,700,000 | 4,000,000 | - | - | 1 |
| 2 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය | 18201 | 5,000,000 | 8,000,000 | 1,100,000 | 4,100,000 | - | - | 2 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 10501 | 140,000,000 | 170,000,000 | 60,000,000 | 90,000,000 | - | - | 3 |
| 4 | අධිකරණ අමාත්‍යාංශය | 22801 | 260,420,000 | 290,420,000 | 170,000,000 | 175,000,000 | 850,000,000 | 1,100,000,000 | 4 |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | 9,000,000 | 12,000,000 | - | - | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 25,000,000 | 24,000,000 | - | - | 6 |
| 7 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 7 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | 23,000,000 | 18,000,000 | 90,000,000 | 100,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර | 27001 | - | - | 35,000,000 | 30,000,000 | - | - | 9 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 65,000,000 | - | - | 10 |
| 11 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 2,000,000 | 1,700,000 | - | - | 11 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 28601 | - | - | 12,000,000 | 11,500,000 | - | - | 12 |
| 13 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 10201 | 15,000,000 | 12,000,000 | 9,500,000 | 8,500,000 | - | - | 13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | - | - | 56,000,000 | 53,000,000 | - | - | 14 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 25801 | - | - | 51,000,000 | 46,000,000 | - | - | 15 |
| 16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 16 |
| 17 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 150,000,000 | 120,000,000 | - | - | 17 |
| 18 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 11601 | 6,000,000 | 7,500,000 | - | - | - | - | 18 |
| 19 | මිනුම්පති දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 86,000,000 | - | - | 19 |
| 20 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 385,000,000 | 290,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 27901 | - | - | 30,000,000 | 26,000,000 | - | - | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | 38,000,000 | 32,000,000 | - | - | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 23 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව | 27501 | - | - | 18,000,000 | 15,000,000 | - | - | 24 |
| 25 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | 8,000,000 | 8,011,000 | - | - | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | 4,000,000 | 5,000,000 | - | - | - | - | 26 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 | - | - | 680,000,000 | 675,000,000 | - | - | 27 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 710,000,000 | 653,000,000 | - | - | 28 |
| 29 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 18801 | 2,000,000 | 2,060,110 | - | - | - | - | 29 |
| 30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 45,000,000 | 44,000,000 | - | - | 30 |
| 31 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 19001 | - | - | 83,000,000 | 60,000,000 | - | - | 31 |
| | එකතුව | | 456,420,000 | 524,991,110 | 2,905,300,000 | 2,666,700,000 | 940,000,000 | 1,200,000,000 | |

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015 අප්‍රේල් 10 දින
කොළඹ 01.



(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.04.27 වැනි දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූර් ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.05.19 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

(අංක 974 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ 2014.10.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*30.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.09.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*31.

නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*32.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*36.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*37.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*38.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*39.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

41.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

42.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

43.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

44.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---